# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1687/13 - 2011 ජනවාරි 04 වැනි අඟහරුවාදා - 2011.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**නගර සභා ආඥාපනත**

නියමය

(255 වැනි අධිකාරිය වන) නගර සභා ආඥාපනතේ 14 වන වගන්තියේ (ඇ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය, ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, 1978 අගෝස්තු මස 10 දිනැති අංක 329/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයෙන් සංස්ථාපනය කරන ලද බණ්ඩාරවෙල නගර සභාව, බණ්ඩාරවෙල මහා නගර සභාව සංස්ථාපනය කිරීම සඳහා 2011 අප්‍රේල් මස පළමුවැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මම නියමයෙන් විසුරුවා හරිමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2011 ජනවාරි මස 03 වැනි දින,
කොළඹ,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

01 - 363/1

1A - G 12033 — 1080 (2011/01)

**මහා නගර සභා ආඥාපනත**

නියමය

මහා නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 2, 3, 5 සහ 9 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය, ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, මෙම නියමයෙන් -

(1) මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම ආඥාපනතේ කාර්යයන් සඳහා මහා නගරයක් විය යුතු යයි ප්‍රකාශ කරමි ;

(2) එම උපලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා, එම මහා නගරයේ පරිපාලන සීමා ලෙස නිශ්චය කරමි ;

(3) මෙම නියමයේ (I) වැනි ඡේදය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මහා නගරය සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කර, එම මහා නගර සභාවට පහත සඳහන් නාමය සහ නිල නාමය පවරමි : -

**"බණ්ඩාරවෙල මහා නගර සභාව";**

(4) බණ්ඩාරවෙල මහා නගර සභාව නගරාධිපතිවරයකු, නියෝජ්‍ය නගරාධිපතිවරයකු සහ තෝරා පත් කරගත් වෙනත් සභිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතුයයි තීරණය කරමි ;

(5) බණ්ඩාරවෙල මහා නගර සභාවේ ධුර කාලය ආරම්භ විය යුතු දිනය 2011 අප්‍රේල් මස පළමුවැනි දිනය වශයෙන් නියම කරමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2011 ජනවාරි මස 03 වැනි දින,
කොළඹ,
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

*I වැනි කොටස*

බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත සඳහන් ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය

(65ජී) බණ්ඩාරවෙල නැගෙනහිර, (65බී) බණ්ඩාරවෙල බටහිර, (65ඊ) ඉණිකම්බැද්ද, (67ජී) වැවතැන්න, (67ඩී) උතුරු කැබිල්ලේවෙල, (67බී) බිඳුනුවැව, (67කේ) ගෙඩියාරොද, (66ජී) තංතිරිය (කොටසක්), (66) කිණිගම, (66ඩී) මහඋල්පත (කොටසක්), (65ඒ) දකුණු කැබිල්ලේවෙල (කොටසක්), (67සී) අඹේගොඩ (කොටසක්), (67) ඇත්තලපිටිය (කොටසක්), (67එච්) දිගනතැන්න (කොටසක්), (69සී) පල්ලේපේරුව (කොටසක්).

*II වැනි කොටස*

**බණ්ඩාරවෙල මහා නගර සභා බල ප්‍රදේශයේ මායිම් උපලේඛනය :-**

**උතුරට :**

අඹේගොඩ ඔය හා කොස්ගොල්ල මාර්ගය හමුවන සපත්තු පාලම ආරම්භක ස්ථානයේ සිට අ.ග.පි. 116 මැට්පිබිය ගම මැදින් වැටී ඇති කොස්ගොල්ල මාර්ගය දිගේ වැලිමඩ මාර්ගය දෙසට ඇති අතුරු මාර්ගය හමුවන ස්ථානය දක්වාද, එතැන්සිට එම අතුරු මාර්ගය වැලිමඩ බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගය හමුවන ස්ථානය දක්වාද, එතැන්සිට වැලිමඩ බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයේ බණ්ඩාරවෙල දෙසට ගමන්කර අඹේගොඩ හන්දියෙන් කිතුල්දෝව අතුරු මාර්ගය හමුවන ස්ථානය දක්වාද, එතැන් සිට අ.ග.පි. 117, දිගනතැන්න ගම හරහා කිතුල්දෝව අතුරු මාර්ගය දිගේ වැව තැන්න පන්සල අසල අ.ග.පි. 116 මැට්පිබිය ගම් මායිම හමුවන ස්ථානය දක්වාද, එතැන් සිට

බණ්ඩාරවෙල හාපත්ගමුව ප්‍රධාන මාර්ගය දිගේ සින්නමාළිගාතැන්න අතුරු මාර්ගය හමුවන ස්ථානය දක්වාද, එතැන් සිට අ.ග.පි. 116 මැටිපිබිය ගම මැදින් වැටී ඇති සින්න මාළිගාතැන්න අතුරු මාර්ගය දිගේ ගොස් අමුණුදෝව හාපත්ගමුව මාර්ගය හමුවන ස්ථානය දක්වාද, එතැන් සිට බණ්ඩාරවෙල ඇටම්පිටිය ප්‍රධාන මාර්ගය හමුවන අමුණුදෝව හන්දිය දක්වා එතැන් සිට බණ්ඩාරවෙල ඇටම්පිටිය ප්‍රධාන මාර්ගයේ ඇටම්පිටිය දෙසට ගොස් ඇත්තලපිටිය ඔය හමුවන පාලම දක්වාද, එතැන් සිට අ.ග.පි. 26, ඇත්තලපිටිය ගම මැදින් වැටී ඇති ඇත්තලපිටිය ඔය දිගේ ගොස් එම ඔය, මායිම දිගේ ඇත්තලපිටිය ඔය හා නත්තරන් කඳුර හමුවන හීල්ඔය ගෙදර අසල ස්ථානය දක්වාත්, එතැන් සිට නත්තරන් කඳුර දිගේ වටගමුව බිදුණුවැව ප්‍රධාන මාර්ගයේ සපුගල්උල්පත බෝක්කුව දක්වාත්, එතැන් සිට වටගමුව බිදුණුවැව ප්‍රධාන මාර්ගය දිගේ බිදුණුවැව දෙසට ගොස් එම මාර්ගය ඌව අධ්‍යාපන පීඨය දෙසට ඇති අතුරු මාර්ගය හමුවන හන්දිය දක්වාත්, එතැන් සිට අතුරු මාර්ගය දිගේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අ.ග.පි. 27 උඩකුඹල්වෙල හමුවන කඳුර දක්වා,

**නැගෙනහිරට :**

ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අ.ග.පි. 27 උඩකුඹල්වෙල ගම හමුවන කඳුරේ සිට එම කඳුර දිගේ බදුල්ල බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයේ එම කඳුර හමුවන බෝක්කුව දක්වාත්, එම බෝක්කුවේ සිට අ.ග.පි. 27 උඩකුඹල්වෙල මායිම දිගේ එනම් බදුල්ල බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයේ බණ්ඩාරවෙල දෙසට ගොස් බිදුණුවැව හන්දිය හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 27 උඩකුඹල්වෙලහි, පල්ලේපේරුව ගම මැදින් වැටී ඇති මිහිදු මාවත දිගේ බණ්ඩාරවෙල හීල්ඔය ප්‍රධාන මාර්ගය හමුවන මීරිය ගහ හන්දිය දක්වාත් එතැන් සිට අ.ග.පි. 27 උඩකුඹල්වෙල දකුණු මායිමේ එනම්, බණ්ඩාරවෙල හීල්ඔය ප්‍රධාන මාර්ගයේ බණ්ඩාරවෙල දෙසට ගොස් ඇල්ල අ.ග.පි. 27 උඩකුඹල්වෙල දකුණු මායිම හා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අ.ග.පි. 19 කිණිගම බස්නාහිර මායිම එනම්, බණ්ඩාරවෙල හීල්ඔය ප්‍රධාන මාර්ගය හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 19 කිණිගම මැදින් වැටී ඇති හීල්ඔය, බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගය දිගේ කිණිගම හන්දිය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 19 කිණිගම මැදින් වැටී ඇති කන්දේඅරාව මාර්ගය දිගේ මහඋල්පත පන්සල හමුවන හන්දිය දක්වා,

**දකුණට :**

මහඋල්පත පන්සල හමුවන හන්දියේ සිට අ.ග.පි. 120 මහඋල්පත ගම මායිම දිගේ අතුරු මාර්ගය දිගේ බණ්ඩාරවෙල පුනාගල ප්‍රධාන මාර්ගය හමුවන මහඋල්පත හන්දිය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 19 කිණිගම මැදින් වැටී ඇති බණ්ඩාරවෙල පුනාගල ප්‍රධාන මාර්ගය දිගේ බණ්ඩාරවෙල දෙසට අ.ග.පි. 33 කැබිල්ලෙවෙල මැදින් වැටී ඇති බණ්ඩාරවෙල පුනාගල ප්‍රධාන මාර්ගයේ බණ්ඩාරවෙල දෙසට ගල්වල හන්දිය හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 118 කැබිල්ලවෙල ගම මැදින් වැටී ඇති එනම්, ශ්‍රී සුමනවංශ මාවත දිගේ ශ්‍රී සුධර්මෝදය පිරිවෙන හමුවන හන්දිය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 118 කැබිල්ලවෙල ගම මැදින් වැටී ඇති අතුරු මාර්ගය දිගේ කහටගහඅරාව හන්දිය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 118 කැබිල්ලවෙල මැදින් වැටී ඇති දඩුගොල්ල අතුරු මාර්ගය දිගේ කහටගහඅරාව කඳුර හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 118 කැබිල්ලවෙල මැදින් වැටී ඇති කහටගහඅරාව කඳුර දිගේ ඉද්දගංඅරාව ඔය හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිය අ.ග.පි. 119 ඕඹඩඇල්ල උතුරු මායිමේ ඇති ඉද්දගංඅරාව ඔය ඇල්ල තොට ඔය හමුවන ස්ථානය දක්වා,

**බටහිරට :**

ඉද්දගංඅරාව ඔය හා ඇල්ල තොට ඔය හමුවන ස්ථානයේ සිට අ.ග.පි. 119 ඕඹඩඇල්ල ගම මැදින් ඇති ඇල්ල තොට ඔය දිගේ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අ.ග.පි. 193 කහත්තවෙල ගම හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 193 කහත්තෙවෙල නැගෙනහිර මායිම දිගේ බණ්ඩාරවෙල නගර සභා සීමාව හමුවන ස්ථානය දක්වාද, එතැන් සිට අ.ග.පි. 193 කහත්තෙවෙල හා බණ්ඩාරවෙල නගර සභා සීමාව වෙන්වෙන මායිම දිගේ බණ්ඩාරවෙල වැලිමඩ ප්‍රධාන මාර්ගය හමුවන ශාන්ත තෝමස් හන්දිය දක්වා, එතැන් සිට හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අ.ග.පි. 193 කහත්තෙවෙල ගම් මායිම හා බණ්ඩාරවෙල නගර සභා සීමාව වෙන්වෙන මායිම දිගේ බණ්ඩාරවෙල ඇටම්පිටිය ප්‍රධාන මාර්ගය හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අ.ග.පි. 193 කහත්තෙවෙල ගම් මායිම හා බණ්ඩාරවෙල නගර සභා සීමාව වෙන්වන මායිම දිගේ පංවැව කඳුර හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට පංවැව කඳුර දිගේ අ.ග.පි. 193 කහත්තෙවෙල උතුරු මායිම හෙවත් අ.ග.පි. 26 ඇත්තලපිටිය ගම දකුණු මායිම දිගේ ගොස් අතුරු මාර්ගය හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට අතුරු මාර්ගය දිගේ බණ්ඩාරවෙල ඇටම්පිටිය ප්‍රධාන මාර්ගය හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 193 කහත්තෙවෙල උතුරු මායිම දිගේ එනම්, දෙහිගස්ඇල්ල කඳුර දිගේ දකුණු දෙසටත් එතැන් සිට අ.ග.පි. 193 බණ්ඩාරවෙල හාපත්ගමුව මාර්ගය හරහා අ.ග.පි. 193 කහත්තෙවෙල ගම් මායිම දිගේ බණ්ඩාරවෙල වැලිමඩ ප්‍රධාන මාර්ගය හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 193 කහත්තෙවෙල උතුරු මායිමේ ඇති සිරිමල්වත්ත කඳුර දිගේ කහගොල්ල ඔය දක්වාත්, එතැන් සිට කහගොල්ල ඔය දිගේ අරාවේ කඳුර දක්වාත් එනම් අ.ග.පි. 116 මැටිපිබිය ගම් මායිම පටන්ගැන්ම දක්වාත් එතැන් සිට අ.ග.පි. 116 මැටිපිබිය ගම මැදින් වැටී ඇති අඹේගොඩ ඔය දිගේ අඹේගොඩ ඔය හා කොස්ගොල්ල මාර්ගය හමුවන සපත්තු පාලම දක්වා ද වේ.

01 - 363/2

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9අ. වැනි වගන්තියේ (*අ*) සහ (*ආ*) ඡේදවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, 1987 මැයි මස 12 දිනැති අංක 453/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව සංස්ථාපනයට අදාළ නියමය, මෙම නියමයෙන් -

(1) (අ) එහි උපලේඛනය ඉවත් කර මෙහි උපලේඛනය ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි;

(ආ) එහි (4) වන ඡේදයේ සඳහන් "අට" යන පදය ඉවත් කර ඒ වෙනුවට "හත්" යන පදය ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි;

(2) මෙම නියමය 2011 අප්‍රේල් මස පළමුවන දින සිට බලාත්මක විය යුතු යයි නියම කරමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2011 ජනවාරි මස 03 වන දින,
කොළඹ,
පළාත් පාලන සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

***I වැනි කොටස***

බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය -

(65ඒ) දකුණු කැබිල්ලේවෙල (කොටසක්), (65සී) කරගහවෙල,, (65ඩී) බැද්දේකුඹුර, (65එෆ් ඕබඩැල්ල, (65එච්) නායබැද්ද වත්ත, (66ඒ) මකුල් ඇල්ල, (66බී) උඩපේරුව, (66සී) දූල්ගොල්ල, (66ඩී) මහඋල්පත (කොටසක්), (66එෆ්) වෙහෙරගලතැන්න, (66ජී) තන්තිරිය (කොටසක්), (66එච්) දරහිටවනාගොඩ, (66අයි) ක්‍රේග්වත්ත, (66ඊ) එගොඩගම, (67) ඇත්තලපිටිය (කොටසක්), (67ඒ) කොත්තහෙල, (67සී) අඹේගොඩ (කොටසක්), (67ඊ) කිරි ඔරුව, (67එෆ්) වටගමුව (67එච්) දිගනතැන්න (කොටසක්) (67ජේ) මාතැටිල්ල, (67එන්) අයිස්ලැබි වත්ත, (70) බඹරගම, (70ඒ) ලියන්ගහවෙල, (70බී) අඹදණ්ඩේගම, (70සී) බැද්දේඅරාව, සහ (70ඩී) ලියන්ගහවෙලවත්ත. -

***II වැනි කොටස (අ)***

**බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා :-**

**උතුරට :**

මාතැටිල්ල ඔය මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ඌව අ. ග. පි. 14 කැබලි අංක 38 බටහිර කෙළවර දක්වාද,එතැන් සිට එම කැබැල්ලේ මායිම් ගල් යෙදූ දකුණු මායිම දිගේ අංක 59, 58 කැබලිවල නැගෙනහිර මායිම දිගේ පිටකඳුර දක්වාද, එතැන් සිට ඌව අ.ග.පි. 31 දකුණු මායිම වන පිටකඳුර දගේ එම පිඹුරේ කැබලි අංක 281 දකුණු කෙළවර පිහිටි මායිම් ගල දක්වාද, එතැන් සිට එම බිම් කැබැල්ලේ දකුණු මායිම දගේ ඌව අ. ග. පි. 27 කැබලි අංක 13 කිව් උතුරු මායිම බටහිර කෙළවර පිහිටි පැරණි මායිම් ගල දක්වා ද,;

**නැගෙනහිරට :**

අවසානයට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඌව අ.ග.පි. 27 කැබලි අංක 13, 13වී, 13ජ්, 13 ඩබ්ලිව්, 13 ඒජ්, 13 ඒබී, 13 සහ 50 යන කැබලිවල බටහිර මායිම දිගේ දික්උල්පොත කඳුර දක්වා ද,

**දකුණට :**

අවසානයට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අ.ග.පි. 27 උඩකුඹල්වෙල ගම හමුවන කඳුර සිට අතුරු මාර්ගය දිගේ ඌව අධ්‍යාපන පීඨය දෙසට ඇති අතුරු මාර්ගය හමුවන හන්දිය දක්වාත්, එතැන් සිට බිඳුනුවැව වටගමුව ප්‍රධාන

මාර්ගය හමුවන හන්දිය දක්වාත්, එතැන් සිට වටගමුව ප්‍රධාන මාර්ගයේ වටගමුව දෙසට ගොස් එම මාර්ගය හමුවන නත්තරන් කඳුර බෝක්කුව දක්වා ගොස් එතැන් සිට නත්තරන් කඳුර දිගේ ඇත්තලපිටිය ඔය හා නත්තරන් කඳුර හමුවන හීල්ඔය ගෙදර අසල ස්ථානය දක්වාත්, එතැන් සිට ඇත්තලපිටිය ඔය දිගේ ගොස් එම ඔය බණ්ඩාරවෙල ඇටම්පිටිය ප්‍රධාන මාර්ගයේ ඇත්තලපිටිය ඔය හමුවන පාලම දක්වාද, එතැන් සිට බණ්ඩාරවෙල ඇටම්පිටිය ප්‍රධාන මාර්ගය හමුවන අමුණුදෝව හන්දිය දක්වාත්, අ.ග.පි. 116 මැටිපිඹිය ගම මැදින් වැටී ඇති සින්නමාළිගාතැන්න අතුරු මාර්ගය දිගේ ගොස් අමුණුදෝව හාපත්ගමුව මාර්ගය මුහුවන ස්ථානය දක්වා ද, එතැන් සිට බණ්ඩාරවෙල හාපත්ගමුව ප්‍රධාන මාර්ගය දිගේ බණ්ඩාරවෙල දෙසට ගොස් කිතුල්දෝව අතුරු මාර්ගය හමුවන ස්ථානය දක්වාද, එනම් වැවතැන්න පන්සල අසල කිතුල්දෝව අතුරු මාර්ගය හමුවන ස්ථානය දක්වාද, එතැන් සිට කිතුල්දෝව අතුරු මාර්ගය දිගේ වැලිමඩ බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයේ කිතුල්දෝව අතුරු මාර්ගය, අඹේගොඩ හන්දිය හමුවන ස්ථානය දක්වා ද, එතැන් සිට වැලිමඩ-බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයේ වැලිමඩ දෙසට ගොස් අ.ග.පි. 116 මැටිපිඹිය ගම ඇති අතුරු මාර්ගය හමුවන ස්ථානය දක්වාද, එම අතුරු මාර්ගය දිගේ කොස්ගොල්ල මාර්ගය හමුවන ස්ථානය දක්වා ද, එතැන් සිට එම කොස්ගොල්ල මාර්ගය හා අඹේගොඩ ඔය හමුවන සපත්තු පාලම දක්වා ද, එතැන් සිට අඹේගොඩ ඔය දිගේ අරාවේ කඳුර දක්වා ද, එතැන් සිට අරාවේ කඳුරේ මධ්‍ය රේඛාව දිගේ කැබලි අංක 223 බටහිර මායිමේ උතුරු කෙළවර දක්වාද එතැන් සිට කැබලි අංක 223 බටහිර මායිම දිගේ එහි නිරිත කෙළවර ත්‍රිකෝණමිතික ස්ථානය දක්වා ද,

**බස්නාහිරට :**

අවසානයට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඌව අ.ග.පි. 387 අංක 53, 51 කැබලිවල මායිම් ගල් යෙදූ ඊසාන මායිම් දිගේ ගොස් එතැන් සිට දඹගොල්ලේ කඳුර වැලිමඩ-දියතලාව මාර්ගය දක්වා ද, එතැන් සිට කැබලි අංක 364 1/2 මායිම් ගල් යෙදූ ඊසාන දිග මායිම දිගේ මහ ඔය නොහොත් මාතැටිල්ලේ ඔය මධ්‍ය ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට ඌව අ.ග.පි. 72 සහ ඌව අ.ග.පි. 63 නැගෙනහිර මායිම වූ මාතැටිල්ලේ ඔයේ මධ්‍ය රේඛාව දිගේ මායිමේ ආරම්භක ලක්ෂ්‍යය දක්වාද වේ.

***II වැනි කොටස (ආ)***

**බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා :-**

**උතුරට :**

අ.ග.පි. 193 කැබලි අංක 363, 362, 356 යන කැබලිවල දකුණු මායිම දිගේ දියතලාව - බණ්ඩාරවෙල මහා මාර්ගය දක්වා ද, එතැන් සිට එම මාර්ගය හරහා ගොස් හමුවන කැබලි අංක 358 දරන දිය පහර දිගේ කහත්වෙල ඔයේ මධ්‍ය ලක්ෂය දක්වාද, එතැන් සිට ඇල්ලතොට ඔය දිගේ බණ්ඩාරවෙල මහා නගර සභාව සඳහා යෝජිත අ.ග.පි. 119 ඕබඩැල්ල ගම උතුරු මායිමේ ඇති ඉද්දගංඅරාව ඔය ඇල්ලතොට ඔය හමුවන ස්ථානය දක්වාත් එතැන් සිට ඉද්දගංඅරාව ඔය මැදින් වැටී ඇති අ. ග. පි. ඕබඩැල්ල ගමමායිම දගේ ඉද්දගංඅරාව ඔය හා කමටගහ අරාව කඳුර හමුවන ස්ථානය දක්වාත් එතැන් සිට කහටගහඅරාවේ කඳුර දිගේ කහටගහඅරාව කඳුර, දඩුගොල්ල අතුරු මාර්ගය හමුවන ස්ථානය දක්වාත් එතැන් සිට දඩුගොල්ල අතුරු මාර්ගය දිගේ කහටගහඅරාව හන්දිය දක්වාත් එතැන් සිට බණ්ඩාරවෙල පූනාගල ප්‍රධාන මාර්ගය අ.ග.පි. 118 කැබිල්ලේවෙල ගම මැදින් වැටී ඇති අතුරු මාර්ගය දිගේ ශ්‍රී සුමන වංශ මාවත හමුවන හන්දිය දක්වාත් එනම් ශ්‍රී සුධර්මෝදය පිරිවෙන හමුවන හන්දිය දක්වාත්, එතැන් සිට ශ්‍රී සුමනවංශ මාවත දිගේ බණ්ඩාරවෙල පූනාගල ප්‍රධාන මාර්ගය හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට බණ්ඩාරවෙල - පූනාගල ප්‍රධාන මාර්ගයේ අ.ග.පි. 33 කැබිල්ලේවෙල ගම් මායිම හමුවන වලස්බැද්ද කඳුර හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 33 කැබිල්ලේවෙල හා අ.ග.පි. 19 කිනිගම හරහා යන බණ්ඩාරවෙල - පූනාගල ප්‍රධාන මාර්ගය හමුවන මහඋල්පත හන්දිය දක්වාත්, එතැන් සිට අ.ග.පි. 120 මහඋල්පත උතුරු මායිමෙන් වැටී ඇති කන්දේඅරාව මාර්ගය දිගේ මහඋල්පත පන්සල හමුවන හන්දිය දක්වා ද, එතැන් සිට අ. ග. පි. 19 කිනිගම මැදින් වැටී ඇති කන්දේඅරාව මාර්ගය දිගේ හීල්ඔය - බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගය හමුවන කිනිගම හන්දිය දක්වාත් එතැන් සිට ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බස්නාහිර මායිමේ එනම් බණ්ඩාරවෙල-හීල්ඔය ප්‍රධාන මාර්ගයේ ශීල්ඔය දෙසට ගොස් මීරියගහ හන්දිය දක්වාත් එතැන් සිට ඇල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ බස්නාහිර මායිම හා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැගෙනහිර මායිම එනම් බණ්ඩාරවෙල-හීල්ඔය ප්‍රධාන මාර්ගය හමුවන ස්ථානය දක්වාත්, එතැන් සිට ඌව අ.ග.පි. 19 අංක 8 ඒඩබ් කැබැල්ලේ උතුරු මායිමෙන් ඇරඹෙන මාර්ගය දක්වාද,

**නැගෙනහිරට :**

අවසානයට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට එම මාර්ගය දිගේ ඌව අ.ග.පි. 27 කැබලි අංක 61 මායිම් ගල් යදූ බටහිර මායිමේ උතුරු මායිම්ගල දක්වා ද, එතැන් සිට කැබලි අංක 61 බටහිර හා දකුණු මායිම දිගේ කැබලි අංක 39 බටහිර මායිම දක්වා ද, එතැන් සිට කැබලි අංක 39 බටහිර මායිම දක්වා ද, එතැන් සිට කැබලි අංක 39 බටහිර සහ දකුණු මායිම දිගේ ඇති ජල මාර්ගය දිගේ කිතල්ඇල්ල ඔය දක්වාද, එතැන් සිට කිතල්ඇල්ල ඔය දිගේ ඌව අ.ග.පි. 27 ගම් සීමාව අවසානය දක්වා ගොස් හමුවන කිතල්ඇල්ල කනපත්දරේ කඳුර දෙමෝය දක්වාද, එතැන් සිට කනපත්දොරේ කඳුර දිගේ ඉහළට ඌව අ.ග.පි. 25 කැබලි අංක 47 වයඹ කෙළවර මායිම දක්වා ද, එතැන් සිට ඌව අ.ග.පි. 25 කැබලි අංක 16බී 1 බටහිර මායිම දක්වා ද, එතැන් සිට බණ්ඩාරවෙල බඹරගම මාර්ගය දක්වා ද, එතැන් සිට එම මාර්ගය දිගේ ඌව අ.ග.පි. 280 කැබලි අංක 16 දකුණු කෙළවර මායිම්ගල දක්වා ද, එතැන් සිට ඌව අ.ග.පි.

280 බටහිර මායිම දිගේ වැටී ඇති කැබලි අංක 119බී, 119ඒ, 119 දරන මාර්ගය දිගේ කැබලි අංක 120 දරන මලආර දක්වා ද, එතැන් සිට එම මල ආර දිගේ මහඔය මධය ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට එම ඔය දිගේ ඌව අ.ග.පි. 272 කැබලි අංක 37 බටහිර කෙළවර දක්වා ද, එතැන් සිට කැබලි අංක 37 දකුණු මායිම දිගේ කැබලි අංක 35 මායිම් ගල් යෙදූ බටහිර මායිම දිගේ එම මායිමේ පිහිටි වැවතැන්න ත්‍රිකෝණමිතිකස්ථානය දක්වා ද, එතැන් සිට එම පිඹුරේ අංක 35, 38,40,41,42,115 කැබලිවල බටහිර මායිමදිගේ ගොස් හමුවන කැබලි අංක 117 දරන කරඳගොල්ල ඔය දක්වාද, එතැන් සිට කරඳගොල්ලඔය හරහා ද, අංක 116 දරන කැබැල්ලේ බටහිර මායිම දක්වා ද, එතැන් සිට කැබලි අංක 116 බටහිර මායිම දිගේ කරඳගොල්ල ඔයේ ශාඛාව දක්වා ද, එතැන් සිට එම ශාඛාව හරහා අංක 118, 224 සහ 225 යන කැබලිවල බටහිර මායිම දිගේ බදුල්ල - මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කවල මායිමේ පිහිටි බුලත් අත්තකඳුරේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද,

**දකුණට :**

අවසානයට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට බදුල්ල - මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කවල මායිම වූ බුලත්අත්ත කඳුරේ මධ්‍ය ලක්ෂ්‍යයේ සිට ඌව අ.ග.පි. 271 කැබලි අංක 48 දකුණු මායිම දක්වා ද, එතැන් සිට කැබලි අංක 48 දකුණු මායිම දිගේ අංක 48 1/3, 48 1/4 48 1/5 යන කැබලිවල දකුණු මායිම දක්වා ද, එතැන් සිට 50, 264, 265, 267, 269, 276, 275 සහ 274 යන කැබලිවල නැගෙනහිර මායිම දිගේ එම මායිම පිහිටි අම්පිටිකන්ද ත්‍රිකෝණමිතික ස්ථානය දක්වා ද, එතැන් සිට එම පිඹුරේ අංක 174, 50, 50එච් දරන කැබලිවල දකුණු මායිම දිගේ අංක 270 දරන බණ්ඩාරවෙල පූනාගල මහා මාර්ගය දක්වා ද, එතැන් සිට අංක 270 කැබැල්ලේ දකුණු මායිම දිගේ ඌව අ.ග.පි. 247 කැබලි අංක 255ඕ කැබැල්ලේ බටහිර මායිම දක්වා ද, එතැන් සිට කැබලි අංක 255ඕ බටහිර මායිම සහ කැබලි අංක 255, 277 මායිම් ගල් යෙදූ දකුණු මායිම දිගේ කැබලි අංක 279 දරන මහඔය මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට මහඔය මධ්‍ය රේඛාව දිගේ කැබලි අංක 255 බටහිර මායිම දක්වා ද, එතැන් සිට කැබලි අංක 255 බටහිර මායිම දිගේ ඌව අ.ග.පි. 121 කැබලි අංක 16 දකුණු මායිම දක්වා ද, එතැන් සිට කැබලි අංක 16 දකුණු මායිම දිගේ ඌව අ.ග.පි. 118 කැබලි අංක 50 නැගෙනහිර මායිම දිගේ දකුණු මායිම් ගල දක්වා ද, එතැන් සිට මායිම් ගල් යෙදූ කැබලි අංක 50 දකුණු මායිම ඌව අ.ග.පි. 119 කැබලි අංක 41 නැගෙනහිර මායිම දකුණු කෙළවර පිහිටි මායිම් ගල දක්වා ද, එතැන් සිට කැබලි අංක 41 දකුණු මායිම දිගේ මායිමේ පිහිටි, පිහිටි මායිම්ගල දක්වා ද,

**බටහිරට :**

අවසානයට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඌව අ.ග.පි. 115 කැබලි අංක 99,96 නැගෙනහිර මායිම දිගේ බණ්ඩාරවෙල කැබිල්ලේවෙල මාර්ගය දක්වාද, එතැන් සිට එම මාර්ගය දිගේ කැබලි අංක 96 නැගෙනහිර මායිමේ පිහිටි මායිම්ගල දක්වා ද, එතැන් සිට කැබලි අංක 96 නැගෙනහිර මායිම දිගේ බණ්ඩාරවෙල - හපුතල මහා මාර්ගය දක්වා ද, එතැන් සිට එම මාර්ගය දිගේ කැබලි අංක 95ඒ ගිණිකොන කෙළවර පිහිටි මායිම් ගල දක්වා ද, එතැන් සිට ඇති කඳුර දිගේ කහගොල්ල ඔය දක්වා ද, එතැන් සිට කහගොල්ල ඔය දිගේ බණ්ඩාරවෙල - දියතලාව මහා මාර්ගය දක්වා ද, එතැන් සිට එම මාර්ගය හරහා ගොස් හමුවන කහගොල්ල ඔයේ මධ්‍ය රේඛාව දිගේ ඌව අ.ග.පි. 193 කැබලි අංක 363 බටහිර මායිම දිගේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

01 - 363/3

---

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

### නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9අ වන වගන්තියේ (අ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, 1987 මැයි මස 12 වැනි දිනැති අංක 453/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඇල්ල ප්‍රාදේශීය සභාව සංස්ථාපනයට අදාළ නියමය, මෙම නියමයෙන් -

(1) එහි උපලේඛනය ඉවත්කර ඒ වෙනුවට මෙහි උපලේඛනය ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි ;

(2) යථොක්ත සංශෝධන 2011 අප්‍රේල් මස පළමුවන දින සිට බලාත්මක විය යුතු යයි නියම කරමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2011 ජනවාරි මස 03 වැනි දින,
කොළඹ,
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

***I වන කොටස***

බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාස වලින් සමන්විත භූමි ප්‍රදේශය-

(68) හල්පේ, (68ඒ) නාවුල්ල, (68බී) ඇල්ල, (68සී) මධුරගම, (68ඩී) කිරින්ද, (68ඊ) යහලෙවෙල, (68එෆ්) ඉඩමේගම. (68ජී) මිල්ලගම, (68එච්) පියරපන්දෝව, (68අයි) දෙමෝදර, (68ජේ) නිව්බර්ග්, (69) උඩුකුඹල්වෙල, (69ඒ) කරඳගොල්ල, (69බී) හීල්ඔය, (69සී) පල්ලේරුව (කොටසක්), (69ඩී) දෝව, (69ඊ) කිතල්ඇල්ල, (69එෆ්) රාවණාඇල්ල, (69ජී) හෙට්ටිපොල, (71) ඉළුක්පැලැස්ස, (71ඒ) ගෝවුස්ස, (71බී) දොඩම්ගොල්ල, (72) ගවරවෙල, (72ඒ) නාවෙල නැගෙනහිර, (72බී) බල්ලාකෙටුව, (72බී1) නමුණුකුල, (72සී) පුපුල, (72ඩී) පුපුල බටහිර, (72ඊ) ගල්ටැංහේන, (72එෆ්) නාවෙල බටහිර, (72ජී) මැදවෙල බටහිර සහ (72එච්) බැද්දේවෙල.

***II වැනි කොටස***

**ඇල්ල ප්‍රදේශීය සභාවේ පරිපාලන සීමා-**

**උතුරට :**

පියරපන්දෝව කඳුර - මායිම් ඇල්ල කඳුර දෙමෝය සිට පියරපන්දෝව කඳුර දිගේ නැගෙනහිරට පියරපන්දෝව කඳුර - කෑදැත්ත කඳුර දෙමෝය දක්වා ද, එතැන් සිට කෑදැත්ත කඳුර මධ්‍ය රේඛාව දිගේ එහි ආරම්භක ලක්ෂ්‍ය දක්වා ද, එතැන් සිට ඌව අ.ග.පි. 31 අංක 16 ආර් 1 දරන කැබැල්ලේ මායිම් ගල් යෙදූ නැගෙනහිර මායිම දිගේ අංක 16 ආර් 2 දරන ගම්සභා පාර දක්වා ද, එතැන් සිට නැගෙනහිර දෙසට එම ගම් සභා පාර දිගේ ඌව අ.ග.පි. 28 කැබලි අංක 4 ඒ 27 ගිණිකොන කෙළවර පිහිටි මායිම් ගල දක්වා ද, එතැන් සිට 4 ඒ 27, 4 ඒ 28, 4 ඒ 71, 4 ඒ දරන බිම් කැබලි වල මායිම් ගල් යෙදූ නැගෙනහිර හා දකුණු මායිම දිගේ කටුගල්ගොඩ කන්ද ත්‍රිකෝණ මිතික ස්ථානය දක්වා ද, එතැන් සිට කඳුර දිගේ ඌව අ.ග.පි. 174 දඩුගල ගමේ දකුණු ගම් මායිමේ පිහිටි කිරින්දේ කඳුර දිගේ ඌව අ.ග.පි. 174 රේ කැබලි අංක 76 එන් දරන අඩිපාර දක්වා ද, එතැන් සිට එම පිඹුරේ කැබලි අංක 23 ඒ ඊ, 23 ඒ අයි, 23 ඒ එෆ්, 23 ඒ ජී, 90, 91, 95 දරන කැබලි වල දකුණු මායිම දිගේ කොස්ගොල්ල කඳුර දක්වා ද, එතැන් සිට ඌව අ.ග.පි. 175 වැල්ගොල්ල ගමේ දකුණු මායිමේ පිහිටි මායිම් ගල් යෙදූ අඩිපාර දිගේ එම පිඹුරේ අංක 25 ජී, දරන බිම් කැබැල්ලේ දකුණු මායිමේ පිහිටි, පිහිටි මායිම් ගල දක්වා ද එතැන් සිට 25ජී, 25වී, 25 එක්ස්, 41, 42 දරන බිම් කැබලි වල මායිම් ගල් යෙදූ දකුණු මායිම දිගේ බටගොල්ලේ කඳුර දිගේ, බටගොල්ල කඳුර වැල්ගොල්ලේ කඳුර දෙමෝය දක්වා ද, එතැන් සිට උතුරට වැල්ගොල්ල කඳුර - හබරොස්සේ කඳුර දෙමෝය දක්වා ද, එතැන් සිට හබරොස්ස කඳුර මධ්‍ය රේඛාව දිගේ ඌව අ.ග.පි. 176 කැබලි අංක 44 නිරිත දිග කෙළවර පිහිටි මායිම් ගල දක්වා ද, එතැන් සිට කැබලි අංක 44 දකුණු මායිම දිගේ නාවුල්ල හේන ත්‍රිකෝණමිතික ස්ථාන හරහා බණ්ඩාරවෙල - බදුල්ල මහා මාර්ගය දක්වා ද, එතැන් සිට බදුලු ඔය හරහා ඌව අ.ග.පි. 176 කැබලි අංක 12 1/2, 87, 8ඒ, 8 දරණ කැබලි වල මායිම් ගල් යෙදූ දකුණු මායිම දිගේ ඌව අ.ග.පි. 177 කැබලි අංක 91 වයඹ කෙළවර දක්වා ද, එතැන් සිට ඌව අ.ග.පි. 177 කැබලි අංක 91 බටහිර මායිම්, කැබලි අංක 92 බටහිර දකුණ සහ නැගෙනහිර මායිම සහ කැබලි අංක 93, 85, 96, 94 දකුණු සහ නැගෙනහිර මායිම දිගේ පුහුපස්ගල ත්‍රිකෝණමිතික ස්ථානය හරහා ඌව අ.ග.පි. 182 කැබලි අංක 156 දරන පාරේ මායිම් ගල් දක්වා ද, එතැන් සිට අඩිපාර දිගේ කැබලි අංක 158 දරන බල්ලකෙටුව - පස්සර පාර දක්වා ද එතැන් සිට එම පාර දිගේ කැබලි අංක 161 වයඹ කෙළවර පිහිටි මායිම් ගල දක්වාද, එතැන් සිට කැබලි අංක 161 මායිම් ගල් යෙදූ බටහිර සහ දකුණු මායිම දිගේ ඌව අ.ග.පි. 1 නාවෙල ගම් සහ ඌව අ.ග.පි. 550 කනවරැල්ල යන ගම් දෙකේ මායිම් වෙන්වන මායිමේ පිහිටි මායිම් ගල දක්වා ද,

**නැගෙනහිරට :**

අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ඌව අ.ග.පි. 1 නාවෙලගම සහ ඌව අ.ග.පි. 550 කනවරැල්ල යන ගම් දෙක වෙන්වන මායිම් ගල් යෙදූ ගම් මායිම දිගේ දකුණු දෙසට ඌව අ.ග.පි. 548 කැබලි අංක 576 වයඹ කෙළවර පිහිටි මායිම් ගල දක්වා ද, එතැන් සිට ඌව අ.ග.පි. 548 අංක 576 සහ 258 දරණ කැබලි වල බටහිර සහ දකුණු මායිම දිගේ ඇල්ල - පස්සර මහා මාර්ගය දක්වා ද, එතැන් සිට ඇල්ල - පස්සර මහා මාර්ගයේ මධ්‍ය රේඛාව දිගේ ඇල්ල - පස්සර පාර සහ නමුණුකුල - මියනකඳුර පාර හන්දිය දක්වා ද, එතැන් සිට නමුණුකුල මියනකඳුර මාර්ගයේ මධ්‍ය රේඛාව දිගේ ඌව අ.ග.පි. 548 කැබලි අංක 338 වයඹ කෙළවර මායිම් ගල දක්වා ද, එතැන් සිට එම පිඹුරේ කැබලි අංක 338, 281, 280 දරන බිම් කැබලිවල බටහිර හා දකුණු මායිම දිගේ කැබලි අංක 281 දකුණු මායිමේ පිහිටි ඌව අ.ග.පි. 549 නාවෙල - පිංඅරාව සහ ඌව අ.ග.පි. 258 දේවතුර යන ගම්වල ගම් මායිම් වෙනස් වන මායිම් ගල දක්වා ද, එතැන් සිට බදුල්ල - මොණරාගල පරිපාලන දිස්ත්‍රික්ක වෙන් වන මායිම දිගේ දකුණට ඌව අ.ග.පි. 277 අංක 122 දරන කැබැල්ලේ ගිණිකොන මායිමේ පිහිටි, පිහිටි මායිම් ගල දක්වා ද,

**දකුණට :**

අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට බදුල්ල - මොණරාගල පරිපාලන දිස්ත්‍රික්ක වෙන්වන මායිම දිගේ බුලත්අත්තේ කඳුර දක්වා ද, එතැන් සිට ඌව අ.ග.පි. 271 කැබලි අංක 48, 42 1/2, 292, 41, 40, 39, 38 දරන කැබලිවල මායිම් ගල් යෙදූ නැගෙනහිර මායිම දිගේ පිටවෙල ඔය දක්වා ද එතැන් සිට එම පිඹුරේ කැබලි අංක 23, 22, 20, 12 එෆ් සහ 12 ඊ දරණ කැබලි වල මායිම් ගල් යෙදූ නැගෙනහිර මායිම දිගේ කිතුල්ගල කන්ද ත්‍රිකෝණමිතික ස්ථානය දක්වා ද එතැන් සිට 12 එෆ්, 12 සී, 12 බී, 4, 1 ඒ, 1 දරන කැබලිවල මායිම් ගල් යෙදූ නැගෙනහිර මායිම දිගේ වැවතැන්න ත්‍රිකෝණමිතික ස්ථානය දක්වා ද, එතැන්සිට කැබලි අංක 296 දරන කැබලිවල

මායිම් ගල් යෙදූ බටහිර මායිම දිගේ සහ කැබලි අංක 2 මායිම් ගල් යෙදූ උතුරු මායිම දිගේ මහඔය දක්වා ද එතැන් සිට මහඔය මධ්‍ය රේඛාව දිගේ උෟව අ.ග.පි. 247 කැබලි අංක 7 ඊශාන කෙළවර දක්වා ද එතැන් සිට උෟව අ.ග.පි. 247 කැබලි අංක 7, 6, 4, 2 සහ අංක 1 දරන කැබලි වල උතුරු මායිමේ පිහිටි අඩිපාර දිගේ අංක 1 දරන කැබැල්ලේ උතුරු කෙළවර පිහිටි මායිම් ගල දක්වා ද එතැන් සිට උෟව අ.ග.පි. 19 කැබලි අංක 430 නිරිත කෙළවර මායිම් ගල් යෙදූ ගම් මායිම දිගේ කැබලි අංක 8 සීආර් 17 බිම් කැබැල්ලේ උතුරු කෙළවර පිහිටි මායිම් ගල දක්වා ද එතැන් සිට වයඹ දෙසට කඳුර දිගේ කිතල්ඇල්ල දක්වා ද එතැන් සිට උෟව අ.ග.පි. ඩී 9 උතුරු සීමාව වන කිතල්ඇල්ල ඔය දිගේ එම අංක 18 කැබැල්ල හරහා ගමනාරම්භකරන ලක්ෂ්‍යය දක්වා ද එම ලක්ෂ්‍යයේ සිට 18 බිම් කට්ටියේ උතුරු මායිම දිගේ ජල මාර්ගය සහ මායිම් ගල් යෙදූ මායිම් 24 කැබැල්ලේ නැගෙනහිර ජල මාර්ගය මායිම් ගල් යෙදූ එම කැබැල්ලේ නැගෙනහිර මායිම සහ උෟව අ.ග.පි. 19 උතුරු මායිම කිතල්ඇල්ල සිට බදුල්ල බණ්ඩාරවෙල මාර්ගය දක්වා වැටී ඇති මාර්ගය දිගේ පිඹුරේ 8 ඩීආර්එස් 3 ද,

**බටහිරට :**

අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට බණ්ඩාරවෙල මහා නගර සභාව සඳහා යෝජිත නැගෙනහිර මායිම දිගේ බණ්ඩාරවෙල හීල්ඔය ප්‍රධාන මාර්ගය හමුවන මීරියගහ හන්දියේ සිට ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අ.ග.පි. 27 උඩකුඹල්වෙල හි පල්ලේපේරුව ගම මැදින් වැටී ඇති මිහිඳු මාවත දිගේ බදුල්ල බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයේ බිඳුනු වැව හන්දිය හමුවන ස්ථානය දක්වාත් එතැන් සිට බදුල්ල බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගය දිගේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම දිගේ බදුල්ල බණ්ඩාර වෙල ප්‍රධාන මාර්ගයේ අ.ග.පි. 27 උඩකුඹල්වෙල ගම් මායිම දැක්වෙන කඳුර හමුවන බෝක්කුව දක්වාත් එතැන් සිට කඳුර දිගේ අ.ග.පි. 26 ඇත්තලපිටිය දකුණු මායිමේ ඇති අතුරු මාර්ගය දක්වාත් එතැන් සිට ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන්වන කඳුරේ සිට අ.ග.පි. 26 කැබලි අංක 426, 435, 10 කැලෑ මැනුම් මූලික පිඹුරු 115 කැබලි 3 බීඩී 10, 3 බීඩී 5, 3 බීඩී 6, 3 බීඩී 4, 3 බීඩී 3, 3 ඩබ්ලිව්, 63 එම්, 63 බීසී දරන මායිම් ගල් යෙදූ නැගෙනහිර මායිම දිගේ 63 බීසී දරන කැබැල්ලේ ඊශාන කෙළවර මායිම ගල දක්වා ද එතැන් සිට උෟව අ.ග.පි. 31 කැබලි අංක 281, 484, 277, 280 දරන කැබලි වල මායිම් ගල් යෙදූ නැගෙනහිර මායිම දිගේ කැබලි අංක 280 ඊශාන කෙළවර පිහිටි මායිම් ගල දක්වා ද, එතැන් සිට උෟව අ.ග.පි. 22 කැබලි අංක 20 එන්, 20 කේ, 20 ඩී දරන කැබලි වල මායිම් ගල් යෙදූ නැගෙනහිර මායිම දිගේ 20 ඩී දරන කැබැල්ලේ උතුරු කෙළවර පිහිටි මායිම් ගල දක්වා ද, එතැන් සිට පියරපන්දෝව කඳුර දිගේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය වූ මායිම් ඇල්ල කඳුර පියරපන්දෝව කඳුර දෙමෝය දක්වා ද වේ.

01-363/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.